# කළුතර මල් අස්නේ විහාරයට සහ දේවාලයට අයත් අප්‍රකාශිත වටුතන්ත්‍රි තඹ සන්නස

ඩබ්.එල්.ඒ. බුද්ධිෂ ජයශාන් වීරසූරිය[1]

කළු ගඟ පහළ නිම්න ප්‍රදේශය යනු ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පශ්චාත් යටත්විජිත සමය දක්වාම අඛණ්ඩ ජනාවාසකරණයේ ප්‍රසාරණයක් සෙමෙන් සිදුවූ භූගෝලීය කලාපයකි. ඉහත දක්වූ කාල රේඛාවේ කෝට්ටේ යුගය සමග ආබද්ධවන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උග්ගල්බඩ ග්‍රාමයේ පිහිටා ඇති මල් අස්නේ රාජ මහා විහාරය සහ පත්තිනි දේවාලයට අයත් වටුතන්ත්‍රි නම් තඹ සන්නස හැඳින්විය හැකිය. මල් අස්නේ විහාරයේ සහ දේවාලයේ පෞරාණිකත්වය තහවුරු කරන ප්‍රධානතම සාධකය වන්නේ කෝට්ටේ කේන්ද්‍ර කරගනිමින් රජකළ හය වැනි පරාක්‍රමබාහු රජු ක්‍රි.ව 1443 දී විහාරයට සහ දේවාලයට අයත් සීමා ලකුණු කරමින් ප්‍රදානය කළ මෙම තඹ දාන පත්‍රයයි. දිගින් අඟල් 16 ක් පමණ දිගු මෙය පළලින් අඟල් 10 කි. කෝට්ටේ යුගයේ වෙනත් අභිලේඛනයන්හි ඇති සිංහල අක්ෂර භාවිත කර ඇති අතර අක්ෂර බැඳ ලිවීම කැපීපෙනෙයි. මෙම වැදගත් අභිලේඛනය පිළිබඳ මෙතෙක් විධිමත් පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදුවී නොමැත. මෙම තඹ සන්නස අධ්‍යයනය කිරීම තුළින් කෝට්ටේ සමයේ පරිපාලන තන්ත්‍රය, විහාර සහ දේවාල සඳහා රජු දැක්වූ අනුග්‍රහය, කෝට්ටේ යුගයේ භාෂාව, සීමා නිර්ණය කිරීමේ ක්‍රමවේදය, පැරණි නීතිය සහ ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි පරිපාලන කටයුතු ආදී පැතිකඩ කිහිපයක ලක්ෂණ අධ්‍යයනය සඳහා අවකාශය හිමි වේ. තව ද මෙම සන්නස සමග කෝට්ටේ යුගයේ අනෙක් අභිලේඛන සහ වෙනත් සාහිත්‍ය කෘති සංසන්දනාත්මක ප්‍රවේශයකින් විමසීමෙන් හය වැනි පරාක්‍රමබාහු රජු සපුමල් කුමරු ලවා ලංකාවේ උතුරු ප්‍රදේශය යටත් කරගැනීමේ වර්ෂය පිළිබඳ පිළිගත් මතවාදයට වඩා වෙනත් ප්‍රවාදයක් ගොඩනැගීමේ හැකියාව ද පවතියි. එහිදී ප්‍රධාන වශයෙන්ම රාජකීය නාමය උදෙසා යොදා ඇති අභිදානයක් වන ත්‍රිසිංහලාධීශ්වර යන්න යෙදීමේදී සමකාලීන ශිලා ලේඛනයන්හි භාවිත කර ඇති ස්වරූපයන්හි වෙනස්කම් මේ උදෙසා යොදා ගනියි. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස කෝට්ටේ යුගය පිළිබඳ මූලික අධ්‍යයනයකින් පසු ක්ෂේත්‍ර අධ්‍යයනයක් ඔස්සේ සන්නසෙහි පෙළ කියවා ගැනීමත් එය පදානුපදිකව විවරණය කිරීමත් පසුව අදාළ ඓතිහාසික සන්ධර්භයේ සන්ධර්භගත කරමින් අර්ථකථනය කිරීමත් සිදුකරන ලදි. ඉහත ක්‍රමවේදයට අනුව සන්නස පිළිබඳ අධ්‍යයනයෙන් පුරාවිද්‍යාත්මක ඓතිහාසික වශයෙන් වැදගත් වන්නා වූ වටුතන්ත්‍රි තඹ සන්නස ප්‍රකාශයට පත්කිරීම් වැදගත්කම හා එහි අන්තර්ගතය ආශ්‍රයෙන් සමකාලීන දේශපාලන, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික තොරතුරු අධ්‍යයනය කිරීමත් මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද : වටුතන්ත්‍රි තඹ සන්නස, කෝට්ටේ යුගය, කළු ගඟ පහළ නිම්නය, අභිලේඛන අධ්‍යයනය

---

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. buddisha96@gmail.com